නාවිතාන්වේලි ප්‍රාදේශීය සභාව
අම්පාර දිස්ත්‍රික්කය
---------------------

1 මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 11 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 21 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 සැප්තැම්බර් 21 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-----------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට නාවිතාන්වේලි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලවීම
----------------------------------------------------------------

රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 2 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශ ඉදිරිපත් කළ යුතු වූවද, එවැනි මුදල් ප්‍රවාහ ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති
-------------------------

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 03 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සකස්කිරීම සඳහා අනුගමනය කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

1.3.3 ගිණුම්කරණ අඩුපාඩු
----------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණ විය.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ගෙවියයුතු රු. 11,500 ක විගණන ගාස්තු සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) විවිධ ආයතනවලින් ප්‍රාදේශීය සභාව වෙත කාර්යාල උපකරණ පහලොවක් ලැබී තිබුණද, එහි වටිනාකම තක්සේරුකර වත්කම් ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ඇ) ප්‍රාදේශීය සභාව සතුව ට්‍රක්ටර් සහ ටේයිලර් රථ හතරක් තිබුණද, එහි වටිනාකම් තක්සේරුකර වත්කම් ගිණුම්වලට ගෙනවිත් නොතිබුණි.

1.3.4 ලැබියයුතු සහ ගෙවියයුතු ගිණුම්
-----------------------------------

2006 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වාවූ කාලපරිච්ඡේදයට අයත් හිඟ මස් කඩ බදු රු. 2,523,081 ක මුදල අයකර ගැනීමට හෝ ඒ අයට එරෙහිව නීත්‍යානුකූලව කටයුතු කිරීම සඳහා විගණන දිනය වන 2015 ජුලි 14 දිනය දක්වා කටයුතු කර නොතිබුණි.

1.3.5 නීති, රීති , රෙගුලාසි ආදියට අනුකූල නොවීම
---------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා විගණනයේදි නිරීක්ෂණය විය.

| | නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 158 වන වගන්තිය | සභා බල ප්‍රදේශයේ සියළුම කොට්ඨාශවලින් වරිපනම් බදු අයකර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| | මුදල් රෙගුලාසි 880 | මුදල් සහ ගබඩා ද්‍රව්‍ය පරිපාලනම වශයෙන් භාරදී තිබූ නිලධාරීන් දෙදෙනෙකුගෙන් ඇප තැන්පත් ලබා ගෙන නොතිබුණි. |
| (ඇ) | IAI/2002/02 හා 2002 නොවැම්බර් 28 දින භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක 10 ක් සහ පරිගණක උපකරණ මෘදුකාංග පිළිබඳ සටහන් කිරීම සඳහා පරිගණක ලේඛනයක් පවත්වා තොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය
----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය
----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ඉක්මවූ පුනරාවර්තන වියදම් රු. 2,398,010 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් රු. 1,172,876 ක්වූයෙන් මූල්‍ය ප්‍රතිඵලවල රු. 3,570,886 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණ.

2.2 ආදායම් පරිපාලනය
----------------------

2.2.1 වරිපනම් බදු
-------------

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තිය අනුව සභාව විසින් ආදායම් අයකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවීමට නොහැකිවීමෙන් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ තිබෙන ඉඩම් හා ඉදිකරන ලද නිවාස, ගොඩනැගිලි විලින් 2006 වර්ෂයේ සිට 2014 වර්ෂය අවසානය දක්වා වරිපනම් බදු ගණනය කර අයකර ගැනීමට තටයුතු නොකරීම නිසා වර්ෂයකට රු. 300,000 ක් පමණ ආදායමක් අහිමිවී තිබුණි.

2.2.2 බලපත්‍ර ගාස්තු අයකිරීම්
-------------------------

සභා බලප්‍රදේශයේ සන්නිවේදන ආයතන විසින් ස්ථාපිත කර තිබූ සන්නිවේදන කුළුනු 02 ක් සඳහා 2009 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා අයකර ගතයුතු බලපත්‍ර ගාස්තු රු. 96,000 ක් පමණක් සභාව විසින් අයකර නොතිබුණි.

2.2.3 මුද්දර ගාස්තු
--------------

2013 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු මුද්දර ගාස්තු ප්‍රමාණය ගණනන කර රෙජිස්ටාර් ජනරාල් වරයාගෙන් අයකර ගැනීම සඳහා 2014 ජූලි 14 වන දිනය දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3 මෙහෙයුම් සමාලොචනය
-----------------------------

3.1 කළමණාකරණ දුර්වලතා
-----------------------------

යුනොප්ස් (UNOPS) ආයතනයෙන් ප්‍රතිසංස්කරනය කරන ලද මාර්ග නඩත්තු කිරීමේ සේවය සඳහා ගෙවීම් කිරීමේ අදහසින් ලංකා බැංකුවේ 2009 වර්ෂයේ ආරම්භ කරන ලද ජංගම ගිණුම් 2013 වර්ෂය සිට විගණන දිනය වන 2015 ජූලි 14 දින දක්වා නිෂ්ක්‍රීයව පවතියද රාජ්‍ය ගිණුම් දෙපාර්තමෙන්තුවේ අංක 105/98 අනුව වසා දැම්මට කටයුතු කර නොතිබුණි.

3.2 කොන්ත්‍රාත් පාලනය
-----------------------

ප්‍රදේශයතුල රැකියා අවස්ථා ඇති කිරීමේ සමාජීය අරමුණ ලඟාවීම සඳහා ඉදිකිරීම් කොන්ත්‍රාත් දීමේදී ප්‍රසම්පාදන ක්‍රියා පරිපාටිය අනුව අනුමත දෙශීය සමිතිවලට සහභාගිත්වය ලබාගත හැකි බව සඳහන් වූවද සමාලෝචිත වර්ෂයේදී රු. 170,000 වටිනා කොන්ත්‍රාත් දෙකක් ලබා දීමේදී ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග අනුගමනය නොකර සභා තීර්ණය මත පමණක් සමිති දෙකකට කොන්ත්‍රාත් භාරදී තිබුණි.

3.3 අදාල යෝග්‍යතා සමීක්ෂණ නොකර 2010 වර්ෂයේදී රාජ්‍ය නොවන සංවිධානයකින් ඉදිකර ප්‍රාදේශීය සභාවට භාර දෙන ලද රු. 3,000,000 වටිනා ඝණ අපද්‍රව්‍ය මධ්‍යස්ථාන මහජනතාවගේ විරෝධය හේතුවෙන් අද දක්වා ක්‍රියා නොකර ප්‍රයෝජනට නොගෙන තිබුණි.

4 ගිණුම්කටයුතුභාවය හා යහපාලනය
--------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය
------------------------

එක් එක් පළාත් පාලන ආයතන තමන්ගේ හැකියාව අනුව අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා ගත යුතු බව පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යංශයේ 2005 නොවැම්බර් 08 වන දින හා අංක 03 දරණ පළාත් පාලන ප්‍රතිසංස්කරනය පිළිබඳ චක්‍රලේඛයේ 8 වන ඡේදයෙන් පෙන්වාදී තිබූ පරිදි සභාවේ අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නොතිබුණි.

5 පද්ධති හා පාලන
--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) ස්ථාවර වත්කම් පාලනය
(ඈ) අත්තිකාරම් අයකර ගැනීම
(ඉ) කොන්ත්‍රාත් පරිපාලන